# කළුවර එලිය



රචනා කළේ -;

අසදි හිමායා ප්‍රනාන්දු

කතෘ

අසදි හිමායා ප්‍රනාන්දු

චිත්‍ර

අසදි හිමායා ප්‍රනාන්දු

කෘතියේ අයිතිය

අසදි හිමායා ප්‍රනාන්දු

මුද්‍රිත දිනය

2023 නොවැම්බර්

ISBN 978-624-206-735-3

# පිදුම

ආදරණීය තාත්තාට, අම්මාට,

මල්ලීට,

සිප් සතර කියා දෙන

දයාබර ගුරුවරුන්ට

සහ

කියවීම කැමති

සියලුම දෙනාට................

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත ” බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි  එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින්  ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා  දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු  පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමකුරීමේ ප්‍රතඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක ” වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක ”ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින්  “දිවිය දිනන විද්‍යුත ” පොතක් “ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලද දරුවන්ට අතද්දැකීම් සමුදායක ” මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතවූ න වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක ”ලියන්නට සිහින දකනි දරුවන් සහෝදරතව්යෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක ” “ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අතද්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තයික ”වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමකු ළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම  නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යොජනාව ඉදිරිපතක්රමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි


ශෂිකලා  සේනාධීර

විදුහල් පතනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023    10    20

එක සුන්දර ගම්මානයක ලස්සන පුංචි ගෙදරක අම්මයි, තාත්තයි නැති ලස්සන ගැහැනු ළමයෙක් හිටියා. ඈ උපතින්ම ඇස් නොපෙනෙන අහිංසක දරුවෙකි. ඇය ජීවත් වුණේ ඇගේ ආච්චි අම්මා සමගය. ඇගේ නම නිත්‍යා. ඈ හරිම යහපත් ගතිගුණ ඇති ඉතා හොඳ දරුවෙක්. ඈ එතරම් යහපත් වූයේ ඇගේ පෙර පිනකට බව ආච්චි අම්මා නිතර කියනවා. ඈ දෙස බලන අයෙක් නැවත ඈ දෙස හැරී බලනු නොඅනුමානයි.



ඈ බේල් ක්‍රමයට 6 වන ශ්‍රේණියේ ඉගෙන ගත්තා. ඈ සෑම අවුරුද්දේම පන්තියේ පළවෙනියා. එතරම් ඈ දක්ෂය.



දිනක් ඇගේ පාසලේ චිත්‍ර තරඟයක් තිබුණා. ඇයට දෑස් නොපෙණුනත් හොඳින් චිත්‍ර ඇඳීමේ හැකියාවක් ද තිබුණා. ගුරුවරු මෙන්ම පාසලේ අනෙක් ළමුන් ද ඈ ගැන පුදුමයට පත් වුණා. නමුත් ඇයට චිත්‍ර තරඟයට යාමට තරම් වත්කමක් තිබුණේ නැහැ.



ඈ සිටියේ ඉතා දුකින්ය. එදින ගෙදර ඇවිත් ඈ ආච්චි අම්මාට ''ආච්චි අම්මේ මට චිත්‍ර තරගයට යන්න ඕනේ'' කියා හඬා වැටුණා. එවිට ආච්චි අම්මාගේ දෑසින් කඳුළු වැටුණා.

පසු දා ඇය පාසල් ගිය පසු ඇගෙ පන්තියේ ගුරුතුමිය ළමයින්ට පැවසුවා ''චිත්‍ර තරගයට යන ළමයි අත උස්සන්න බලන්න'' කියා. එවිට නිත්‍යාගේ දෑසින් කඳුළු වැටුණා. ගුරුතුමිය ඇයගෙන් ''ඇයි දුව අඬන්නේ '' යැයි ඇසුවා. '' ගුරුතුමී මම ජීවත් වෙන්නේ ආච්චි අම්මා එක්ක. ඒ නිසා ආච්චි අම්මාට මට චිත්‍ර තරගයට අවශ්‍ය දේවල් අරන් දෙන්න බැහැ.''

ඇගේ හොඳම මිතුරිය වන දුලීෂාට ඈ ගැන දුක හිතුනා.





දුලීෂාගේ අම්මයි තාත්තයි දෙදෙනාම වෛද්‍යවරු. ඈ පාසල නිම වී ගෙදර ගොස් අම්මාට හා තාත්තාට නිත්‍යා ගැන පැවසුවා. එවිට ඇගේ දෙමව්පියන් නිත්‍යාට උදව් කිරීමට කැමති වුණා.

පසුදා සෙනසුරාදා දවසක් දුලීෂා සහ ඇගේ දෙමව්පියෝ නිත්‍යාගේ නිවසට ගියේ හිස් අතින්ම නෙවෙයි. චිත්‍ර තරගයට අවශ්‍ය සියල්ල රැගෙන.

එවිට නිත්‍යාගේ ඉහේ මලක් පිපුණා වගේ. ඉන්පසු නිත්‍යා හා ආච්චි අම්මා දුලීෂාට සහ ඇගේ දෙමව්පියන්ට බොහෝ ස්තූති කළා. ඈ ඉතා සතුටට පත්වුණා. පින් දුන්නා.



චිත්‍ර තරගය ළඟ ළඟම ආවා. ''දුවේ, චිත්‍ර තරගය හෙට නේද? ආච්චි අම්මා ඇසුවාය. ''ඔව් ආච්චි අම්මේ'' පසුදා උදාවුණා. නිත්‍යා ආච්චි අම්මාට වැඳ, දුලීෂා දුන් දේවල් රැගෙන චිත්‍ර තරගයට ගියා. ඈ සිතින් ඇගේ සිතුවම සමඟ තනි වී ඉතා අලංකාර සිත් ඇදගන්නා සුන්දර සිතුවමක් ඇන්දා.

නොබෝ දිනකින් චිත්‍ර තරගයේ ප්‍රථිඵල ආවා. නිත්‍යා චිත්‍ර තරගයෙන් පළමු ස්ථානය ලබා සමස්ත ලංකා තරගයට තේරී පත්ව ඇති බව විදුහල්පතිතුමිය විසින් පැවසුවා.



ක දිනකින් සමස්ත ලංකා තරගයට ද ඇය සහභාගි වුණා. ඇය එහිදී ද ඉතා සිත්ගන්නාසුලු සිතුවමක් සිත්තම් කළා. ඈ සමස්ත ලංකා තරගයෙන් ද පළමු ස්ථානය හිමිකර ගැනීමට සමත් වුණා.

ඇගේ පාසලේ ගුරුවරු, ළමයින් සහ දෙමාපියන් ඇයව අගය කළේ මහත් ප්‍රසංශාවෙන්.






නිත්‍යා නිවසට ගොස් ඒ ගැන ආච්චි අම්මාට පැවසුවා. ආච්චි අම්මාට අදහා ගන්න බැරි සතුටක් ආවා.

නිත්‍යාට පදක්කම්, සහතික, තෑගි බෝග මෙන්ම මුදල් ත්‍යාග ද ලැබුණා. ඇගේ පාසලෙන් ඇයට සුබ පතා උත්සවයක් ද සංවිධානය කළා.

ඇයට දෑස් නොපෙණුනත් ඇය මෙවැනි ජයග්‍රහණයක් ලබාගැනීම ඉතා ආදර්ශමත් ක්‍රියාවක් බව විදුහත්පතිතුමිය ප්‍රකාශ කළා.

ටික දිනකින් ඈ නොසිතූ ලෙස ඇගේ ආච්චි අම්මා ඈ හැරදා මෙලොවින් සමුගන්නට වුණා. ඈ නැවත මෙලොව තනි වුවා. නමුත් ඇගේ ආච්චි අම්මා ඇයට දායදයක් මෙන් යමක් ඉතිරි කරගොස් තිබුණා. ඒ ආච්චි අම්මාගේ දෑස් යුගලයි.

ඇගේ යෙහෙළිය වූ දුලීෂාගේ දෙමාපියන්ගේ මැදිහත්වීමෙන් නිත්‍යාට ඇගේ ආච්චි අම්මාගේ දෑස් බද්ද කොට මේ සුන්දර ලෝකේ සුන්දරත්වය ඇගේ දෑසින්ම දැක බලාගැනීමට සැලැස්වුවා.

ඈ දැන් ලෝකය දෑසින් දකින දක්ෂ අහිංසක නිත්‍යාය.



නිමි.

පසවුදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඞුදුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20

***රචනා කළේ - අසදි හිමායා ප්‍රනාන්දු***

***මහාමායා බාලිකා විදුහල - මහනුවර***



Bar code : 9 786242067353